හිමකම් ඇවිරිණි.

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## වර්ෂ අවසාන ඇගයීම - 1999
## ගණිතය

9 ශ්‍රේණිය

නම / අංකය:..............................................

කාලය පැය : 2 . 30 යි

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.


01. මධ්‍යම ප්‍රමාණයේ අත්කොට කමිසයක් මැසීම සඳහා රෙදි මීටර 1.6 අවශ්‍ය වේ. එවැනි කමිස 6 ක් මැසීමට අවශ්‍ය රෙදි ප්‍රමාණය ආසන්න මීටරයට නිමානය කරන්න.

02. දර්ශක පිළිබඳ දැනුම භාවිතයෙන් සුළුකරන්න.

i. $a^2 \times a^5 \times a^{-3}$

ii. $\frac{p^7}{p^2}$

03. රූපයේ දක්වා ඇති තොරතුරු අනුව a හි අගය සොයන්න.




04. දිග, පළල හා උස පිළිවෙලින් 15 cm, 10 cm හා 8 cm වූ ඝනකාභ හැඩැති භාජනයක ධාරිතාව ලීටරවලින් කොපමණද?

05. ගණනය කිරීමකදී ශිෂ්‍යයෙක් තම සාමාන්‍ය ගණකයේ යතුරු භාවිතා කළ අනුපිළිවෙල පහත දැක්වේ.

ON/C → 1 → 2 → + → 3 → x → 2 → =


මනුට ගණකයේ තිරය මත ලැබෙන පිළිතුර කීයද?

06. $x = \frac{1}{2}$ නම් $y = x^2 + 6x$ සමීකරණයෙහි $y$ හි අගය සොයන්න.

07. දී ඇති වෙන් රූපයේ දක්වා ඇති තොරතුරු අනුව,

i. සර්වත්‍ර කුලකයේ අවයව ලියා දක්වන්න.

ii. P කුලකයේ අනේකත්වය ලියන්න.




08. සූර්යයාගේ සිට සිකුරු ග්‍රහයාට ඇති දුර 108 000 000 km වේ. මෙම අගය විද්‍යාත්මක අංකනයෙන් ලියා දක්වන්න.


09. ග්‍රිනිච් වේලාව 1000 h වන විට ශ්‍රී ලංකාවේ වේලාව සොයන්න. (1996 ඔක්තෝම්බර් 26 දින සිට ශ්‍රී ලංකාවේ වේලාව සම්මත වේලාවට වඩා පැය භාගයකින් වැඩි කරන ලදී. (ලංකාව 5 වෙනි කාල කලාපයේ පිහිටා ඇත.)

www.vajirapani.blogspot.com

10. සදිශ සංඛ්‍යා පිළිබඳ දැනුම භාවිතයෙන් අගය සොයන්න.

i. $(-36) \div (-4)$

ii. $(-18) \div (+9)$





11. රූපයේ දක්වා ඇති A නම් වෘත්තාකාර තැටිය කේන්ද්‍රය වටා නිදහසේ භ්‍රමණය වනසේ සවිකර ඇත. A තැටිය කරකවා එය නිසල වූ විට B දර්ශකය ඉදිරියෙන් 1 ඉලක්කම ලැබීමේ සම්භාවිතාව සොයන්න.

12. දී ඇති ද්විපද ප්‍රකාශන දෙකේ ගුණිතය ලබා ගැනීමට පහත සඳහන් හිස්තැන් පුරවා ලියන්න.

$(x+5)\ (y-3) =$ xy ...... + 5y .......

13. රූපයේ දක්වා ඇති AB හා CD සරල රේඛා සමාන්තරද ? (පිළිතුරට හේතු දක්වන්න)





14. පාසල් ගොඩනැගිල්ලක බිත්තියේ සිට සෑම විටම දුර 2m සිටිනයේ ළමයෙක් ගමන් කරයි. පථ පිළිබඳ දැනුම භාවිතයෙන් ඔහුගේ ගමන් මාර්ගය ඇඳ දක්වන්න.

15. රුපියල් 200 වටිනා අත් ඔරලෝසුවක් 15% ලාභ තබාගෙන විකුණන ලදී

i. ලාභය කොපමණද ?


ii. විකුණුම් මිල කොපමණද?

16. 6m ක් උස කොඩි කණුවක් $1\frac{1}{2}$ m පොළව තුලට වනසේ සිටුවා ඇත. (රූපයේ දක්වා ඇති පරිදි) කොඩිගයේ පොළවෙන් ඉහල කොටස සමාන කොටස් තුනකට බෙදා ඇත. කොටසක දිග සොයන්න.




17. නගර දෙකක් අතර දුර 60 km වේ. x km දුරක් යාමට වැයවන ඉන්ධන ප්‍රමාණය 1 ℓ කි. ඉන්ධන ලීටරයක මිල රුපියල් 50.00 කි. වැයවන මුදල රුපියල් R නම් R සඳහා සූත්‍රයක් ගොඩ නගන්න.

18. රූපයේ ABC ත්‍රිකෝණයේ වර්ගඵලය ABD ත්‍රිකෝණයේ වර්ගඵලය මෙන් කී ගුණයක් ද? හේතු දක්වන්න.




19. සිතියමක පරිමානය 1 : 5000 ලෙස දක්වා ඇත. සිතියමේ නගර 2 ක් අතර දුර 6 cm නම් එම නගර දෙක අතර සැබෑ දුර කිලෝමීටර වලින් සොයන්න.

VajirapaniAravinda